**ශීර්ෂය 226- ආගමන හා විගමන දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම, සැසඳුම් ප්‍රකාශනය, සහ වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ 3.1.2 වගුවේ ඇතුළත් ආදායම් සංකේතයකට අදාළ ආදායම් ගිණුමක්ද, ශීර්ෂය 226 දරන ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුමෙන් හා සැසඳුම් ප්‍රකාශනයෙන් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සාමජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

## 1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරිම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන විෂය පථය

---

ශීර්ෂය 226 - ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනිම, නීති,රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 ඔක්තෝබර් 23 දින දෙපාර්තමේන්තුවේ පාලක ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.14දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 128 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහන් සාරාංශ ගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටු කර තිබුණ බව නිරීක්ෂණය විය.

| මුදල් රෙගුලාසි 128(1) - ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය | | ගණන්දීමේ නිලධාරීගේ එම විධිවිධානයට අනුගත වී නොතිබීම | නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|---|
| 128(1)(අ) | රජය විසින් නියමකර දක්වා ඇති ප්‍රතිපත්තිය හා බලය දෙනු ලැබූ කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසා දීමෙහිලා පාර්ලිමේන්තුවේ අභියෝගයන් ගැන සැලැකිල්ලට ගෙන තම දෙපාර්තමේන්තුවේ කටයුතු විචක්ෂණ භාවයෙන් යුක්තව සැලැසුම් කර ක්‍රියාත්මක කරන බව සහ ප්‍රස්තුත වර්ෂය සඳහා නියමිත වැඩසටහන සම්පූර්ණ කිරීමට සහ නියමිත ඉලක්කය සාක්ෂාත් කර ගැනිමට පරිශ්‍රමයක් දක්වා තිබීම. | 1. ක්‍රියාකාරී සැලැස්ම නිවැරදි ලෙස පිළියෙල කර නොතිබුණි. | 2.1.2(අ) |
| | | 2. ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාණවත් පරිදි සැලැසුම් නොකිරීම. | 2.2.(අ) |
| | | 3. මුදල් නිදහස් කර තිබුණත්, ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති | 2.2.(අ) |
| | | 4. ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු | 2.2(ආ) |
| 128(1)(ආ) | තම දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය හා ගිණුම්කරණය සඳහා සංවිධානය සාර්ථක බවට සහ අවශ්‍ය අවස්ථාවලදී රජයට ලැබිය යුතු ගාස්තු නිවැරදිව නිශ්චය කිරීමට ඒවා ක්‍රමානුකූලව ද සම්පූර්ණයෙන්ම ද අප්‍රමාදව ද එකතු කර ගැනීමට සහ ලැබෙන මුදල් ගිණුම්ගත කිරීමටද, රජය වෙනුවෙන් වගකීම්වලට බැඳීම් සඳහා බලය දීමටද ඉටුකරන ලද සේවාවන් සැපයීම් අධීක්ෂණය හා පරීක්ෂා | 1. අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබා නොගැනීම | 2.2.(අ) |
| | | 2. ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු | 2.2(ආ) |

| | | | |
|---|---|---|---|
| | කිරීමට සහ එම රජයේ අරමුදලින් ඒ සඳහා අප්‍රමාදව හා නිවැරදිව ගෙවීම් කිරීමට ඉන් ප්‍රමාණවත් තරම් විධිවිධාන සලසා තිබීම. | | |
| 128(1)(ඇ) | මුදල් රෙගුලාසි හා රජයේ වෙනත් පරිපූරක නියමයන් තම දෙපාර්තමේන්තුවේදී පිළිපදිනු ලබන බවට හා අවශ්‍ය අවස්ථාවලදී ඒවාට අතිරේක වශයෙන් දෙපාර්තමේන්තු නියමයන් නිකුත් කරන බව | 1. අනුකූල නොවීම් | 2.13 |
| 128(1)(ඇ) | ලැබීම්, ගෙවීම් හා නිකුත් කිරීම් සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර සෝදිසි ක්‍රමයක් පවත්වා ගෙන යන බවට හා ඒ ක්‍රමයේ ක්‍රියාකාරීත්වය කලින් කල සෝදිසි කරන බව | 1. ආදායම් ගිණුම්වල අඩුපාඩු<br>2. රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ සඳහන් අඩුපාඩු | 2.9<br>2.10 |
| 128(1)(ඉ) | රජය සතු වූ හෝ රජයේ භාරයේ පවත්නා මුදල් බඩුබාහිර උපකරණ හා වෙනත් වත්කම් සුරක්ෂිතව තබා ගැනීම සහ සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් තරම් සහ විධිමත් විධිවිධාන යොදවනු ලබන බව, ඒවා වරින්වර සත්‍යාක්ෂණය කරනු ලබන බවටත්, ඒවා නිසියාකාරව නිෂ්කාශණය කරනු ලබන කල්හි එසේ නිෂ්කාශණය කිරීම නියමිත රෙගුලාසිවලට හා උපදෙස්වලට අනුකූලව කරනු ලබන බව | 1. වත්කම් කළමනාකරණයේ අඩුපාඩු | 2.3 |
| 128(1)(ඊ) | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා හෝ භාණ්ඩාගාරය හෝ විසින් ඉල්ලා සිටින තොරතුරු, ප්‍රකාශ හා වාර්තා නිවැරදිව කලට වේලාවට ඉදිරිපත් කරන බව | 1. ක්‍රියාකාරී සැලැස්ම නිවැරදි ලෙස පිළියෙල කර නොතිබුණි.<br>2. ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාණවත් පරිදි සැලසුම් නොකිරීම | 2.1.1<br>2.2 |
| 128(1)(උ) | හිඟව තිබෙන ගාස්තු යනාදිය අයකර ගැනීමට විශේෂ | 1. රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ | 2.10 |

| | | | |
|---|---|---|---|
| | විධිවිධාන යොදන බවට සහ එම කාර්ය පැවරී ඇති නිලධාරීන් විසින් හිඟ මුදල් පිළිබඳව ඒවා අයකර ගැනීම කඩිනම් කිරීමට ගනු ලැබූ පියවර පිළිබඳව යටත් පිරිසෙන් තුන් මාසයකට වරක් හෝ අන්‍යාකාරයකින් විධානය කළ පරිදි හෝ තමා වෙත වාර්තා කරන බව, | හිඟහිටි ණය ශේෂ අයකර ගැනීම | |
| 128(1)(ක) | ගණන්දීමේ නිලධාරියා වශයෙන් තමා වගකීමට බැඳී සිටින වියදම් ශීර්ෂයක එක් එක් වැඩසටහන වෙනුවෙන් මුදල් වර්ෂය අවසානයේදී විසර්ජන ගිණුමක් ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත ඉදිරිපත් කරනු ලබන බව | 1. විසර්ජන ගිණුමේ සඳහන් අඩුපාඩු | 2.8(ඉ) |
| **මුදල් රෙගුලාසි 128(2) - රාජ්‍ය ආදායම් ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය** | | | |
| 128(2)(අ) | අදායම් සංකේතයට අදාළ ආදායම් ඇස්තමේන්තු සම්පූර්ණ ලෙසත්, හැකිතාක් නිවැරදිවත් පිළියෙල කිරීම | 1. අපේක්ෂිත ආදායම වැඩිවීමකදී හෝ අඩුවීමකදී ආදායම් ඇස්තමේන්තුව සංශෝධනය කිරීමට පියවර නොගැනීම | 2.9 |

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

---

### 2.1 කාර්යසාධනය

---

#### 2.1.1 සැලැසුම් කිරීම

---

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2017 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී දෙපාර්තමේන්තුව විසින් ඉටු කළ යුතු ප්‍රධාන කාර්යභාරයන් 31 ක් පැවැති අතර, ඉන් අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීම සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්ම සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) අපේක්ෂිත ප්‍රධාන කාර්යයන් ඉටු කෙරෙන ආකාරයට ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාළ වාර්ෂික අයවැය පදනම් කර ගත් ප්‍රමුඛතා අනුව සකස් කළ ක්‍රියාකාරකම් සැලැසුම (Activity Plan), ක්‍රියාත්මක කළ කාල රාමුව (Time Line) හා එම

ක්‍රියාකාරකම්වල අපේක්ෂිත නිමවුම්/ ප්‍රතිඵල (Output/ Outcome) ඇස්තමේන්තු කර සඳහන් කර නොතිබුණි.

(ඈ) දෙපාර්තමේන්තුව විසින් ආදායම් සංකේතයන් සඳහා ආදායම් එකතු කිරීම ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර නොතිබුණි.

## 2.1.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුව විසින් ප්‍රධාන කාර්යභාරයන් 31 ක් ඉටු කළ යුතුව තිබුණත්, ඉන් කාර්යභාරයන් 20 ක් පමණක් ඉටු කර තිබුණි. එසේ ඉටු නොකළ ප්‍රධාන කාර්යයන් සඳහා එකතුව රු.මිලියන 319.5 ක ප්‍රතිපාදන සලසා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී 1948 අංක 20 දරන ආගාමික හා විගාමික පනත හා ඒ යටතේ පනවන ලද 1956 රෙගුලාසි සහ ජාත්‍යන්තර නීති වලට අනුකූල වන පරිදි ශ්‍රී ලංකාවට ඇතුළුවන හා එහි රැදී සිටින විදේශිකයන්ගේ ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම, ආගාමික හා විගාමික නීති උල්ලංඝණය කරමින් රැදී සිටින විදේශිකයන් පිළිබඳව නිරීක්ෂණය කර අත්අඩංගුවට ගැනීම, රඳවා තබා ගැනීම, රටින් ඉවත් කිරීම හෝ රටින් පිටුවහල් කිරීම සඳහා අවශ්‍ය විමර්ෂණ කටයුතු මෙහෙයවීම සහ නීතිමය ක්‍රියාමාර්ග ගැනීම් 392 සම්බන්ධයෙන් කටයුතු සිදුකර තිබුණු නමුත් වීසා රහිතව රැදී සිටි 2,739 සම්බන්ධයෙන් ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි.

(ඇ) තානාපති කාර්යාල හරහා ද්විත්ව පුරවැසිභාවය ඉල්ලුම් කිරීමේදී 2015 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා අයදුම්පත්‍ර 21,342 ක් ලැබී තිබුණ අතර එම අයදුම්පත්‍ර වලින් සහතික පත්‍ර 7,308 ක් එනම් සියයට 35 ක පමණ ප්‍රමාණයක් නිකුත් කර නොතිබුණි.

(ඈ) 2015 සිට 2017 දක්වා වර්ෂයන් තුළ පුරවැසිභාවය ඉල්ලුම් කිරීම වෙනුවෙන් තානාපති කාර්යාල හැර අයදුම්පත්‍ර 17,273 ක් ලැබී තිබුණ අතර එයින් 2017 දෙසැම්බර් 31 දක්වා සහතිකපත්‍ර 5,823 නිකුත් කර නොතිබුණි. මේ අනුව ඉදිරිපත් කළ අයදුම්පත්වලින් සියයට 34 ක පමණ ප්‍රතිශතයක කාර්ය නිම කර නොතිබුණි.

(ඉ) 1984 අංක 18 දරණ පුරවැසි පනතේ 5(2) වගන්තිය යටතේ එක් අයකු හෝ දෙදෙනාම ශ්‍රී ලාංකිකයන් වන දෙමව්පියන්ට දාව විදේශ රටවල උපත ලැබූ දරුවන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කිරීම් 2015 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා ලියාපදිංචි කිරීම සඳහා අයදුම්පත්‍ර 34,924 ක් ලැබී තිබුණ අතර ඉන් 11, 092 හෙවත් සියයට 32 ලියාපදිංචි කර නොතිබුණි.

## 2.2 ප්‍රසම්පාදන ක්‍රියාවලිය මඟින් සැපයීම් හා සේවා ලබා ගැනීම

-----------------------------------------------------------------

(අ) **ප්‍රසම්පාදන ක්‍රියාවලියන් සැලසුම් කිරීම**

---------------------------------------------

දෙපාර්තමේන්තුව වෙත සමාලෝචිත වර්ෂයේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියාවලිය මගින් සැපයීම් හා සේවා ඉටු කර ගැනීම සඳහා රු. මිලියන 952.35 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර ඉන් රු.මිලියන 585.28 ක ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණි. සලසා තිබුණු ප්‍රතිපාදන සම්බන්ධයෙන් පිළියෙල කලයුතු ප්‍රසම්පාදන සැලසුම පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(i) ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මේ සමාලෝචිත වර්ෂයේදී ඉටු කිරීමට අපේක්ෂා කර තිබූ රු. මි. 248.5 වටිනාකමැති කාර්යන් 10 ක් දෙපාර්තමේන්තුව විසින් ඉටු කර නොතිබුණි.

(ii) ක්‍රියාකාරී සැලැස්මේ හෝ ප්‍රසම්පාදන සැලැස්මේ නොමැති කාර්යන් දෙකක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.මි.54.11 ක් වැය කර තිබුණි.

(ආ) **ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරිම**

----------------------------------------

(i) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.1 වගන්තිය අනුව තරඟකාරී මිල ක්‍රමය අනුගමනය නොකර අමාත්‍ය මණ්ඩල අනුමැතීන් මඟින් ගමන් බලපත්‍ර මිලදී ගැනීම සිදු කර තිබුණි.

(ii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.6.1 (අ), (ඇ) සහ (ඈ) වගන්ති අනුව 2003 වර්ෂයේ සිට නැවත ඇණවුම් ක්‍රමවේදය යටතේ මිලදී ගැනීමට වරින් වර අනුමැතිය ලබාගෙන තිබුණි.

(iii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ . 6.2.2. වගන්තිය අනුව ලංසු කැඳවීමේ අවම කාල සීමාවන් පවත්වාගෙන යා යුතු වුවත් ද්විත්ව පුරවැසිභාවය පිලිබඳ සහතික පත්‍ර ප්‍රදානය කිරීමේ XVII වන අදියර, XVIII හා XIX අදියරයන් සඳහා මිල කැඳවීමේදී ආයතන වෙත මිල ඉදිරිපත් කල යුතු කාල සීමාවන් සඳහන් නොකර රු. 474,747ක මිල කැඳවීම් කර තිබුණි.

(iv) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.3.(අ) වගන්තිය අනුව ලංසු විවෘත කිරීමේ වගකීම ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමත කරනු ලබන ලංසු විවෘත කිරීමේ කමිටුවට පවරනු ලැබිය හැකි අතර ලංසු විවෘත කිරීමේ කමිටුව මඟින් ලියකියවිලි වල දින මුද්‍රාව තබා කෙටි අත්සන් තැබිය යුතු වුවත් අදියර 4 ක් සඳහා රු. 1,076,091ක ආහාර හා අනිකුත් මුද්‍රණ කටයුතු සඳහා ඉදිරිපත් කරන ලද මිල ගණන් හි දින මුද්‍රාව තබා කෙටිසන් තබා නොතිබුණ අතර ඉදිරිපත් කරන ලද මිල ගණන් 3 කින් අවම මිල සහිත සැපයුම්කරු තෝරා ගැනීම ගැටළු සහගත විය.

(v) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.8 හා 7.8.4 (ඈ) වගන්ති අනුව ලංසු පරීක්ෂා කිරීමේදී බැහැර වීම් සම්බන්ධව සැලකිය යුතු වුවත් අත්සන් නොකරන ලද ලංසු හෝ බලයලත් තැනැත්තකු/තැනැත්තන් විසින් අත්සන් කර නොතිබීම විශාල බැහැර වීම් ගණයේ සැලකිය යුතු වන අතර XVI වෙනි අදියරේ උත්සවය සංවිධානය කිරීමේදී අත්සන් නොකරන ලද ලංසු ඉදිරිපත් කර ඇති ආයතනඇගයීමට පාත්‍ර කර අවම මිල ලෙස තෝරා ගෙන තිබ්මෙන් එම සැපයුම්කරු ඉලක්ක කරගෙන රු.159,500 ක මිල ගණන් තෝරා ගෙන තිබුණි .

## 2.3 වත්කම් කළමනාකරණය

---------------------------

දෙපාර්තමේන්තුව විසින් සංචාරක අමාත්‍යාංශයට අයත් වාහනයක් විධිමත් පරිදි පවරා ගැනීමකින් තොරව භාවිතා කර තිබුණි.

## 2.4 බැඳීම් හා බැරකම්

--------------------

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වාර්ෂික අයවැය සීමාව ඉක්මවා බැඳීම්වලට එළඹීම

------------------------------------------------------

(i) 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 02(අ) ඡේදයට අනුකූලනොවී වැය විෂයයන් 07 ක් සඳහා සලසා තිබුණු රු.මි.315.02 ප්‍රතිපාදනය ඉක්මවා රු.මිලියන 25.56 ක බැරකම් ඇති කර ගෙන තිබුණි.

(ii) 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික අයවැය සීමාව තුළ හඳුනාගනු ලැබූ බැඳීම් පදනම් කරගෙන එම බැඳීම්වලට අදාල භාණ්ඩ හෝ සේවා ලබාගත් පසු ඒ සඳහා ගෙවීමට ඇති මුදල් හා ගිවිසුම්වලට එළඹෙන ලද කොන්ත්‍රාත් සම්බන්ධයෙන් සහතික කළ වැඩවල වටිනාකම බැරකමක් ලෙස සටහන් කළ යුතු බව දක්වා තිබුණද හඳුනාගත් බැඳීම්වලට අදාල රු. 15,647,381 භාණ්ඩ හා සේවා ලැබී නොමැතිව සහ ගිවිසුම්වලට එළඹෙන ලද කොන්ත්‍රාත් සම්බන්ධයෙන් සහතික නොකළ වැඩවල වටිනාකම බැරකමක් ලෙස දක්වා තිබුණි.

## 2.5 පාඩු හා හානි

---------------

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරනය වූ පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) විගණනය වෙත ලබා දුන් ස්ථාවර වත්කම් ලේඛණයේ 2016 මාර්තු 25 දින රු.7,400,000 කට ලබා ගන්නා ලද, 2017 වර්ෂයේ පූර්ණ අලාභ යටතට ගැනුණු මෝටර් රථය ඉවත් කර නොතිබුණි. 2018 අගෝස්තු 31 දින වන විටත් මෙම මුදල් රක්ෂණයෙන් අයකරගෙන නොතිබුණි.

(ආ) 2003 හා 2008 වර්ෂවලදී මිලදී ගෙන තිබු රු. මිලියන 9 කට ආසන්න හිස් ගමන් බලපත්‍ර තොග පොත්වල සටහන් කර නොතිබූ අතර 2018 සැප්තැම්බර් මස 06 වන දින වනවිට වර්ෂ 10 කට අධික කාලයක් ගත වී තිබුණි. තවද භාවිතයට ගෙන නොතිබූ අතර ඒ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

## 2.6 විසඳා නොතිබුණු විගණන ඡේද

දෙපාර්තමේන්තුවට අදාළව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේදවලින් පෙන්වා දුන් ඌනතාවයන් සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් නිවැරදි කර නොතිබුණු ඡේදවලට යොමුව පහත දැක්වේ.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය |
|---|---|---|
| වර්ෂය | ඡේද අංකය | |
| 2016 | 3.6.1(ඇ) | දිරිදීමනා ක්‍රමයෙහි ප්‍රතිලාභවලට හිමිකම්ලබන නිලධාරීන් සඳහා අතිකාල හෝ වෙනත් කිසිදු දීමනාවක් නොගෙවිය යුතු වුවත් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට එසේ ගෙවා තිබුණි. |
| 2016 | 3.9 | 2015 මාර්තු 24 දින රු.7,400,000 කට ලබා ගන්නා ලද වාහනයක් 2016 ඔක්තෝබර් 27 දින අනතුරට ලක්වී පූර්ණ අලාභයක් සිදුවී තිබුණද එම වටිනාකම රක්ෂණ ආයතනයෙන් අයකරගෙන නොතිබුණි. |
| 2016 | 3.11 | වීසා රහිතව රැඳී සිටින්නන් 2,789 ක් වැටලීම හා අත්අඩංගුවට ගැනීම. |

## 2.7 කලමනාකරණ දුර්ලවතා

2016 වර්ෂයේ මූල්‍ය හා කල්බදු මෙහෙයුම් ක්‍රමය යටතේ භාණ්ඩාගාරය විසින් දෙපාර්තමේන්තුවට ලබා දී තිබූ රු. 7,400,00 පිරිවැය වූ වාහනය 2017 වර්ෂයේ පූර්ණ අලාභානි යටතට ගෙන තිබුණි. මේ හේතුව නිසා භාණ්ඩාගාරය විසින් වාහනයේ ලියාපදිංචිය අවලංගු කරන ලෙස දන්වා තිබුණි. රක්ෂණ සමාගමෙන් පූර්ණ රක්ෂණ මුදල අයකර ගැනීමට 2018 ඔක්තෝබර් වන විටත් කටයුතු කර නොතිබුණි.

## 2.8 කාර්යභාරයන් ඉටු කිරිම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය හා ඉකුත් වර්ෂය තුළ දෙපාර්තමේන්තුවට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 2016 | පුනරාවර්තන | 1045.32 | 1038.53 | 6.79 | 0.64 |
| | මූලධන | 1116.47 | 943.01 | 173.46 | 15.53 |
| | **එකතුව** | **2161.79** | **1981.54** | **180.25** | **8.34** |
| 2017 | පුනරාවර්තන | 1240.53 | 1235.03 | 5.51 | 0.44 |

| | | | | |
|---|---|---|---|---|
| මුලධන | 928.20 | 561.55 | 366.65 | 39.50 |
| **එකතුව** | **2168.73** | **1796.57** | **372.16** | **17.16** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාත්මක කිරීමට සැලැසුම් කර තිබුණු කාර්යභාරයන් ඉටු කිරීමට රු.මිලියන 2,116.23 ක මුළු පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කර තිබුණත්, එම ඇස්තමේන්තුවේ සඳහන් ප්‍රතිපාදනය වෙනුවට ඊට අඩුවෙන් ප්‍රතිපාදන සලසා තිබීම නිසා එම කාර්යභාරයන් ඉටු කර නොතිබුණි. මේ නිසා සලසා තිබුණු රු.මිලියන 372.16ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි.

(ආ) දෙපාර්තමේන්තුව විසින් කාර්ය ඉටු කිරීම සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තුව අනුව අවශ්‍ය මුළු ප්‍රතිපාදනය සලසා ගෙන තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විට ශක්‍යතා අධ්‍යයනයන් හා ප්‍රසම්පාදන ක්‍රියාවලියට අදාළ කාර්යයන් ඉටු කිරීමෙන් පසු මුළු ප්‍රතිපාදනයම උපයෝජනය කිරීමට නොහැකිවීම නිසා සලසා තිබුණු මුළු ප්‍රතිපාදනයෙන් රු.මිලියන 55.7ක් හෙවත් සියයට 38 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි.

(ඇ) Process re-engineering of DIE to identity the carder positions සඳහා රු.මි.10 ක් වෙන් කලද ප්‍රගති වාර්තාව අනුව රු.මි.4 දක්වා වෙනස් කර තිබුණද ඒ සඳහා අනුමැතියක් විගණනයට ඉදිරිපත් නොවූ අතර එහි සත්‍ය වියදම රු.මි. 2.15 ක් වූයෙන් එහි මූල්‍ය ප්‍රගතිය සියයට 22 කි.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී නිම කිරීමට අපේක්ෂාවෙන් කාර්යන් 06 ක් රු. මි.126.59 ඇස්තමේන්තු සැලැසුම් කලද ඉන් රු. මි.29.02 පමණක් වැය කර, එම කාර්යන් වර්ෂය තුළදී නිම කිරීමට නොහැකි වීම මත වෙන් කල ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි. භෞතික ප්‍රගතිය පිළිබඳ විස්තර විගණනයට ලබාදී නොතිබුණි.

**(ඉ) විසර්ජන ගිණුම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වැය විෂයයන් 02 ක් සඳහා සලසා තිබුණු රු.මිලියන 117 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් කිසිදු උපයෝජනයක් නොකර මුළුමණින්ම ඉතිරි කර තිබුණි.

(ii) රු. මි. 421 ප්‍රතිපාදන සලසා තිබුණු කාර්යයන් 04 ක් ඉටු නොකිරීම නිසා සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 55 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි.

## 2.9 ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම

දෙපාර්තුමේන්තුව විසින් 2017 වර්ෂය සඳහා ආදායම් සංකේතයක් සඳහා එකතුව රු.මිලියන 15,000 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.මිලියන 15,298.92 ක ආදායමක් රැස්කර තිබුණි. එය සංශෝධිත ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 102 ක් වී තිබුණි.
පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

(අ) **20.03.02.07 දරන ආදායම් සංකේතය**

**-----------------------------------------**

(i) 2017 වර්ෂයේ ආදායම් ඇස්තමේන්තුව රු.මි.17,000 ක මුදල රු.මි. 15,000 ක් වශයෙන් සංශෝධනය කිරීම සඳහා ආගමන විගමන දෙපාර්තමේන්තුවේ පාලක ජනරාල්ගේ 2017 ජුලි 31 දිනැති අංක DIE/FIN/13/2018 ලිපියෙන් ඉල්ලුම් කර තිබුණද භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන් සංශෝධනය සඳහා අනුමැතිය විගණනයට ඉදිරිපත් නොවීය.

(ii) සමාලෝචිත වර්ෂයතුල වීසා රහිතව රැඳී සිටි අයගෙන් අයකිරීම (Overstay), මුදල් පොත හා පරිගණක පද්ධතිය සැසඳීමේදී රු.206,228 ශුද්ධ වෙනසක් නිරීක්ෂණය විය.

(iii) 2017 අප්‍රේල් - ජුනි කාර්තුවට අදාල Merchant Commission & TT ගාස්තුව ලෙස අනුමත කර තිබුණේ රු.30,316,386 ක් වුවද ආදායම ලෙස ගිණුම්ගත කර තිබුණේ රු.19,182,060කි. එම නිසා රු. 11,134,327 වෙනසක් නිරීක්ෂණය විය.

(iv) රු.15,298,923,375 ක් වු ආදායමෙන් සමාලෝචිත වර්ෂයේ රු.924,021 ක මුදලක් ආපසු ගෙවීම ලෙස අඩුවිය යුතු වුවත් ආයතනයේ ලිපි කටයුතු වල ප්‍රමාද දෝෂයන් හේතුවෙන් සාමාලෝචිත වර්ෂයේ ආදායමින් අඩු කර නොතිබුණි.

**2.10 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

--------------------------------------------

දෙපාර්තමේන්තුවට අදාල විෂය අංක 22601 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 39.00 | 39.00 | 30.00 | 30.08 | 143.00 | 140.97 |

**හිඟ හිටි ණය ශේෂ අයකර ගැනීම**

**-----------------------------------**

විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.380,007 ක්වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 01 සිට වර්ෂ 14 ක් දක්වා කාල පරාසයක් ගත වී තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

**2.11 පොදු තැන්පත් ගිණුම්**

**-------------------------**

දෙපාර්තමේන්තුව යටතේ වන පොදු තැන්පත් ගිණුම් 04 ක 2017 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු.මිලියන 6.64. ක් විය. වර්ෂ 2 ක් ඉක්මවූ (ඉඩම් තැන්පතු හැර) එකතුව රු.414,852 ක් වූ තැන්පතු 37ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 2.12 බැංකු ගිණුම් මෙහෙයවීම

මුදල් රෙගුලාසි 395(අ) ප්‍රකාරව එකතු කරන ලද හෝ අඩුකරන ලද හඳුනානොගත් තැන්පතු හෝ ගෙවීම් සම්බන්ධ උපලේඛණ බැංකු සැසඳුම් සමඟ ඉදිරිපත් කල යුතු වුවත් ආයතනය විසින් 2017 වර්ෂයේ පිළියෙල කරන ලද බැංකු සැසඳුම් ප්‍රකාශයන්හි උපලේඛණ ඉදිරිපත් කිරීමට අපොහොසත්වූ රු. 93,218,720 ක හඳුනානොගත් ලැබීම් හා රු.251,290,357ක හඳුනා නොගත් ගෙවීම් සහිතව බැංකු සැසඳුම් පිළියෙල කර තිබුණි.

## 2.13 අනුකූල නොවීම්

### 2.13.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | | | අනුකූල නොවීම |
| --- | --- | --- | --- |
| **(අ)** | | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| | (i) | මුදල් රෙගුලාසි 118(5) | ආදායමින් ආපසු අයකල රු. 558,711 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි අනුව කටයුතු කර නොතිබුණි. |
| | (ii) | මුදල් රෙගුලාසි 571(ඇ) | ඉකුත් වූ තැන්පතු ලෙස සලකනු ලබන්නේ තැන්පත් කළ දින සිට වර්ෂ 2ක් ඉක්මවූ තැන්පතු වන අතර එකී තැන්පතු රාජ්‍ය ආදායමට බැර කළ හැකිය. නමුත් 2017 පෙබරවාරි 08 හා 09 දින තැන්පත් කරන ලද ආපසු ගෙවනු ලබන තැන්පත් මුදල් 2017 පෙබරවාරි 17 දින රාජ්‍ය ආදායමට බැරකර තිබුණි. |
| (ආ) | | ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ 2010 ජනවාරි 04 දිනැති අංක NSCC/2/4/3/2/2/13 දරන ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ දිරි දීමනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම නැමැති චක්‍රලේඛය හා 2012 සැප්තැම්බර් 05 දිනැති අංක EST – 8/ALLOW/04/125/2 දරන ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ දිරි දීමනා ක්‍රමය සංශෝධනය කිරීම නමැති චක්‍රලේඛය | දිරිදීමනා ක්‍රමය අදාලවන නිලධාරීන් සඳහා ආයතන සංග්‍රහයේ ව්‍යවස්ථාපිත විධි විධාන හැර අතිකාල හා වෙනත් දීමනා සඳහා හිමිකම් නොමැති බව දක්වා තිබූ නමුත් ඊට පටහැනිව කමිටු සාමාජිකයින් හැර නියෝජ්‍ය පාලක, සහකාර පාලක හා අනිකුත් කාර්ය මණ්ඩලය වෙනුවෙන් රු. 1,886,000ක් දීමනා ලෙස 2017 වර්ෂයේදී ගෙවා තිබුණි. |

## 2.14 මාන ව සම් පත් කළ මනා කර ණය

----------------------------------

**අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම**

------------------------------------------------------------------------------------------

දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ඉටු කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය, පුරප්පාඩු හා අතිරික්ත කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු. මිලියන 580.19 ක් වැය කර තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 61 | 52 | 9 |
| (ii) | තෘතියික මට්ටම | 498 | 342 | 156 |
| (iii) | ද්විතියික මට්ටම | 439 | 397 | 42 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 145 | 132 | 13 |
| (v) | අනියම්/කොන්ත්‍රාත් | 10 | 7 | 3 |
| | | 1153 | 930 | 223 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 223 ක් පැවැතී තිබුණත්, 2017 වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබුණු විසර්ජන ගිණුම අනුව සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකර ඉතිරි වී තිබුණත්, එම ඉතිරියන් කෙරෙහි කාර්ය මණ්ඩල පුරප්පාඩු පැවැතීම බලපා නොතිබුණි. ඒ අනුව අනුමත කාර්ය මණ්ඩලය අධි ඇස්තමේන්තු කිරීමක් සිදු වී තිබුණු බව විගණනයේදි නිරීක්ෂණය විය.

(ආ) දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය පුහුණු කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු. මි. 5.00 ක සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කර තිබුණේ රු. මි. 3.11 ක් හෙවත් සියයට 62 ක් පමණි.